# 2020 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම
# පළාත් මහ රෝහල - බදුල්ල

## ලියාපදිංචි කර ගැනිමේ පොදු කොන්දේසි

බදුල්ල පළාත් මහ රෝහල වෙත 2020 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයුම් වෙනුවෙන් ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් සඳහා කොන්දේසි පහත පරිදි වේ.

01. අපේක්ෂිත අයදුම්කරුවන් පුවත් පත් දැන්වීම අනුව තමන් සැපයිමට බලාපොරොත්තු වන අයිතමය සඳහා ව්‍යාපාර ලියාපදිංචිය යටතේ ලියාපදිංචි වී තිබිය යුතුය..

02. ඒ අනුව, අයදුම්පත් ලබා ගැනිමේදි අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කල යුතුය.

1 අයදුම්පත් ලබා දෙන ලෙස ඉල්ලා අදාල ආයතනය/පුද්ගලයා විසින් නිකුත් කරන ලද ලිපියක්

11 ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ ජායා පිටපතක්

03. අයදුම්කරුවන් සැපයිමට බලාපොරොත්තු වන භාණ්ඩ හා සේවාවන් පිළිබඳ විස්තර තම අයදුම්පතේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

04. සම්පූර්ණ කරන ලද අයදුම්පත් බදුල්ල පළාත් මහ රෝහල වෙත ඉදිරිපත් කිරීමේදි පහත සඳහන් ලියකියවිලි සමග ඉදිරිපත් කල යුතුය

1 රෝහලෙන් නිකුත් කරන ලද ලදුපතේ සත්‍ය ජායා පිටපතක්

11 ඔබ කිසියම් නිෂ්පාදකයෙකු හෝ විදේශිය නිෂ්පාදන ආයතනයක බලයලත් එකම නියෝජිත ආයතනය වන්නේ නම්, නිෂ්පාදන ආයතනය හෝ එකම නියෝජිත ආයතනය බව සනාථ කරන සහතිකයේ ජායා පිටපතක්

111 ආවරණය වන බල ප්‍රදේශය (මුළු ලංකාවටමද නැතිනම් විශේෂිත කළාපයකට ද යන වග, ඇතුළත් සහතිකයේ ජායා පිටපතක්)

1V ගොඩනැගිලි නඩත්තු කොන්ත්‍රාත්කරුවන් සඳහා ICTAD ලියාපදිංචි සහතිකය

05. සියලුම අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරික්ෂා කිරීමෙන් පසු ලියාපදිංචි කරගනු ලැබේ.

06. භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් සඳහන් කරන ලිපිනයේ ස්ථිරවම ව්‍යාපාරය පවත්වාගෙන යා යුතු අතර සියලුම සංදේශන කටයුතු සිදු කරනු ලබන්නේ අයදුම්පතේ සඳහන් ස්ථිර ලිපිනය සඳහා පමණි. ලිපිනයෙහි වෙනස් වීමක් සිදු වුවහොත්, වහාම නව ලිපිනය දැන්විය යුතුය. එසේ නොවන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීමේ බලය බදුල්ල පළාත් මහ රෝහලේ අධ්‍යක්ෂ සතුවේ.

07. සියලුම සැපයුම්කරුවන්ගෙන් තෝරාගත් සැපයුම්කරුවන් 05 දෙනෙකුගෙන් පමණක් හෝ මිළ ගණන් කැඳවීමට අධ්‍යක්ෂ වෙත බලතල ඇත්තේය.

08. අසාධු ලේඛණයට ඇතුලත් වු කිසිදු භාණ්ඩ හා සේවා සැපයුම්කරුවකු ලියාපදිංචි කරගනු නොලැබේ.

09. මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී සියලු මිළ ගණන් ඉදිරිපත් කල යුත්තේ අදාල සැපයුම් බදුල්ල පළාත් මහ රෝහල වෙත ගෙනවිත් භාරදීම සඳහා වන අතර, එම මිළ ගණන් ඉදිරි මාස තුනකටවත් (03)වලංගු විය යුතුය. ඇණවුම අනුව සැපයීමට නියමිත දින රෝහල වෙත අදාළ භාණ්ඩ හෝ සේවා සපයනු නොලැබුවහොත්, එය එම ඇණවුම අවලංගු කිරීමට හේතුවක් වන අතර, එසේ සැපයීම් ප්‍රතික්ෂේප කරන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ.එසේම, යම් අයිතමයක සාම්පල පරීක්ෂා කිරීමට තීරණය කළහොත්, අදාල සාම්පල නියමිත දිනට රෝහල වෙත ගෙනවිත් ඉදිරිපත් කළ යුතුය.

10. මිළ ගණන් කැඳවීමේදී පිට පිටම අවස්ථා 03ක් මිළ ගණන් ඉදිරිපත් නොකරන ආයතනයන්ගෙන් නැවත මිළ ගණන් කැඳවනු නොලැබේ.

11. ගොඩනැගිලි නඩත්තු කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේදී රු: 200,000.00 ක වාණිජ බැංකුවකින්/ රක්ෂණ සමාගමකින් ලබා ගත් කාර්ය සාධන ඇපකරයක් හෝ මුදලින් රෝහල වෙත තැන්පතු කළ යුතු වන අතර, ගොඩනැගිලි නඩත්තු කොන්ත්‍රාත් ගිවිසුමකටද එළඹිය යුතුය.

12. 2019 වර්ෂයේ සැපයුම් අසතුටුදායක සැපයුම්කරුවන් ලියාපදිංචි කරගනු නොලැබේ.

13. සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමේ අවසාන තීරණය බදුල්ල පළාත් මහ රෝහල අධ්‍යක්ෂ සතු වන්නේය.

14. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහල කෙලවරේ **"2020 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම**" යනුවෙන් සඳහන් කර එවිය යුතු අතර, ලිපි කවරයේ වම්පස පහල කෙලවරේ ආයතනයේ නම සහ ලිපිනය සඳහන් කල යුතුය.

ඉහත සඳහන් සියලු කරුණු සැලකිල්ලට ගෙන ඔබගේ ලියාපදිංචිය ලබාගත යුතුය.

(අයදුම්පත් ලබා ගැනීමට චෙක්පත්/ මුදල් ඇණවුම් ඉදිරිපත් කරන්නේ නම් එම චෙක්පත්/ මුදල් ඇණවුම් නිෂ්කාශනය වූ පසු අයදුම්පත් නිකුත් කෙරේ.)

අධ්‍යක්ෂ,
පළාත් මහ රෝහල,
බදුල්ල.

2019-11-01 වන දින
බදුල්ල, පළාත් මහ රෝහලේදීය.